සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**6 ශ්‍රේණිය** | **නර්තනය** | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නර්තනයේ මූලික අංගහාරය වනුයේ,
(1) දණ්ඩිය යි. (2) මණ්ඩිය යි. (3) නමස්කාරය යි. (4) මිටරියන යි.

02. සෑම ගොඩ සරඹයක් අවසානයේ ම නටනු ලබන විශේෂ පද කොටස,
(1) හමාර පදය වේ. (2) ඉරට්ටිය වේ. (3) කස්තිරම වේ. (4) අඩව්ව වේ.

03. විනෝදාස්වාදය මුල්කොටගෙන නිර්මාණය වී ඇති ගැමි නැටුමක් වන්නේ,
(1) කළගෙඩි නැටුම (2) කුලු නැටුම (3) ගොයම් නැටුම (4) කඩු නැටුම

04. ''සතුටට පත්වීම'' සඳහා බලපාන පරිසර සිද්ධියක් විය හැක්කේ,
(1) මල් පරවීම. (2) ගසක් කැපීම.
(3) ඉර බැස යාම. (4) සමනලයෙකු දැකීම.

05. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක් වන්නේ,
(1) ටින් බෙරය (2) එක්ස්රේ රබාන (3) ගැට බෙරය (4) දඬු බෙරය

06. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස හඳුන්වන්නේ,
(1) ගැටබෙරය යි. (2) තම්මැට්ටම යි. (3) දවුල යි. (4) තාලම්පට යි.

07. පහතරට නර්තන සම්ප්‍රදාය වඩාත් ප්‍රචලිත ප්‍රදේශයකි.
(1) මහනුවර (2) කුරුණෑගල (3) දුම්බර (4) මාතර

08. දේශීය නර්තන සම්ප්‍රදායන්වල තාල තැබීමට යොදා ගන්නේ,
(1) තාලම්පට යි. (2) රබාන යි. (3) අත්මිණිය යි. (4) උඩැක්කිය යි.

09. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ,
(1) වෙස් ඇඳුම් කට්ටලය යි. (2) පබළු ඇඳුම් කට්ටලය යි.
(3) දෙවොල් ඇඳුම් කට්ටලය යි. (4) තෙල්මේ ඇඳුම් කට්ටලය යි.

10. උඩරට සාම්ප්‍රදායික වන්නම් ගණන,
(1) 12 කි. (2) 16 කි. (3) 18 කි. (4) 21 කි.

- **අංක 11 - 15 දක්වා වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11. සෑම ගැමි නැටුමකට ම ගායනා අන්තර්ගත වී ඇත. ( )
12. ගොඩ සරඹ ගණනින් දොළසකි. ( )
13. පා සරඹ නර්තනයේ දී ගැටබෙරය භාවිත කරයි. ( )
14. පන්තේරුව යනු විකල්ප වාද්‍ය උපකරණයකි. ( )
15. ''පාන්දරින් ඉස්කෝලෙට''..... යන ගීතයේ පද රචනය කර ඇත්තේ සෝමතිලක දිසානායක මහතාය. ( )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල (අ) කොටසට ගැලපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා යා කරන්න.**

| (අ) | | (ආ) |
|---|---|---|
| 16. | ගැමි ගැටුම් | ⋆ සෙම්බු නැටුම |
| 17. | පා සරඹ | ⋆ සාමූහික බව |
| 18. | හනුමා වන්නම | ⋆ කොහොඹා කංකාරිය |
| 19. | උඩරට නර්තන සම්ප්‍රදාය | ⋆ සුළු තනි තිත |
| 20. | කළගෙඩි නැටුම | ⋆ දණ්ඩි කඳ |

(1 x 20 = 20)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

01. (i) ප්‍රධාන දේශීය නර්තන සම්ප්‍රදායන් 03 නම් කරන්න. (ල. 03)
    (ii) දේශීය නර්තන සම්ප්‍රදායන්වලට අයත් ප්‍රධාන ශාන්තිකර්ම 03 නම්කර අදාළ සම්ප්‍රදාය ඊට ඉදිරියෙන් ලියා දක්වන්න. (ල. 03)
    (iii) ඔබ උගත් නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ 02 ක් ලියන්න. (ල. 02)
    (iv) එක් දේශීය නර්තන සම්ප්‍රදායකට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් අඳින්න. (ල. 02)

02. (i) සිංහල ගැමි නැටුම් 02 ක් නම්කර, ඒවාට අදාළ උපකරණය අදාළ නැටුම ඉදිරියෙන් ලියා දක්වන්න. (ල. 04)
    (ii) එම ගැමි නැටුම් දෙකට අයත් කවි 02 ක් වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ල. 06)


03. (i) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 03ක් නම් කරන්න. (ල. 03)
    (ii) එම එක් එක් වාද්‍ය භාණ්ඩය භාවිත වන අවස්ථා එක බැගින් ලියා දක්වන්න. (ල. 03)
    (iii) විකල්ප වාද්‍ය භාණ්ඩයක් සකස් කරගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල. 04)

04. (i) බෞද්ධ ජනතාවට වෙසක් උත්සවය වැදගත් වන්නේ කුමන හේතුවක් නිසා ද? (ල. 02)

(ii) වෙසක් උත්සවයේ දී යොදාගනු ලබන සැරසිලි 02 ක් නම් කරන්න. (ල. 04)

(iii) වෙසක් උත්සවය හා සබැඳි සාරධර්ම 02 ක් ලියන්න. (ල. 04)

05. පහත ප්‍රේහේලිකාව සම්පූර්ණ කරන්න.




<u>හරහට</u>

(2) පරිසරය ලස්සන කරන සතෙකි.

(3) උදෑසන එළිය කරයි.

(5) උණ බටවලින් තනා ගන්නා විකල්ප වාද්‍ය භාණ්ඩයකි.

(8) තාලය තැබීම සඳහා භාවිත කරයි.

(10) වෙසක් උත්සවයේ දී සමරනු ලබයි.

<u>පහළට</u>

(1) පාද උපයෝගී කොටගෙන නර්තනය කරයි.

(4) කාන්තාවන්ට සුවිශේෂී නර්තනයකි.

(6) ගොඩ සරඹ නර්තනයේ දී වාදනය කරනු ලබයි.

(7) ද්‍රවිඩ ගැමි නැටුමකි.

(9) සරඹ නර්තනයේ දී තාලයේ වේගය මේ නමින් හඳුන්වයි. (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | 2 | 06 | 3 | 11 | ✓ |
| 02 | 3 | 07 | 4 | 12 | ✓ |
| 03 | 1 | 08 | 1 | 13 | × |
| 04 | 4 | 09 | 1 | 14 | × |
| 05 | 3 | 10 | 3 | 15 | ✓ |

16. සාමූහික බව
17. දණ්ඩි කඳ
18. සුළු තනිතිත
19. කොහොඹා කංකාරිය
20. සෙම්බු නැටුම

(1 x 20 = 20)

## II කොටස

01. (i) උඩරට සම්ප්‍රදාය, පහතරට සම්ප්‍රදාය, සබරගමු සම්ප්‍රදාය (ල. 03)

(ii) කොහොඹා කංකාරිය - උඩරට
දෙවොල් මඩුව - පහතරට
පහන් මඩුව - සබරගමු (ල. 03)

(iii) උඩරට - මහනුවර, කුරුණෑගල, කෑගල්ල (ල. 02)

(iv) අදාළ රූප සටහන ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 02)

02. (i) කළ - කළය
ලී - ලී කෑබලි දෙකක්
කුලු - කුල්ල (ල. 04)

(ii) කවි 02 ක් ලියා ඇත්නම් ලකුණු 06 ක් ලබා දෙන්න.

03. (i) ගැටබෙරය, දවුල, තම්මැට්ටම........... ආදී වශයෙන් (ල. 03)

(ii) අවස්ථා එක බැගින් ලියා ඇත්නම් ලකුණු 03 ක් ලබාදෙන්න. (ල. 03)

(iii) පියවර ලෙස ලියා ඇත්නම් ලකුණු 04 ක් ලබා දෙන්න. (ල. 04)

04. (i) බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සිදුවීම් තුන වන ඉපදීම, බුදුවීම, පිරිනිවන් පෑම යන තෙමඟුල සිහි කිරීම සඳහා (ල. 02)

(ii) වෙසක් කූඩු, කොඩි වැල්, විදුලි බුබුළු, තොරන් (ල. 04)

(iii) දන්සැල් පැවැත්වීම, ලේ දන්දීම, මරණයට කැප වූ සත්ත්වයන් නිදහස් කිරීම. (ල. 04)

05. හරහට

(1) සමනළයා (2) ඉර (5) දඬු බෙරය (8) තාලම්පට (10) තෙමඟුල

පහළට

(1) පා සරඹ (4) කළගෙඩි (6) ගැටබෙරය (7) සෙම්බු (9) ලය (ල. 10)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

6 ශ්‍රේණිය | නර්තනය

නම/ විභාග අංකය:

## ප්‍රායෝගික පරීක්ෂණය

01 කැමති ගායනයක් කිරීම. (ලකුණු 05)

02 නම් කරන ලද ගායනයක් කිරීම.
(කළ, ලී, නැළවිලි, හනුමා වන්නමේ කවියක්) (ලකුණු 05)

03 02 වන පා සරඹය හා හමාර පදය නර්තනය කරන්න. (ලකුණු 10)

04 පළමු ගොඩ සරඹය කස්තිරම සමඟ මධ්‍යලයට නර්තනය කරන්න. (ලකුණු 10)

05. කැමති ගැමි නැටුමක් ඉදිරිපත් කරන්න.
(කළ හෝ ලී) (ලකුණු 10)

06. ගීතයකට අනුව නර්තනයක් ඉදිරිපත් කරන්න.
(1) පාන්දරින් ඉස්කෝලට ......
(2) මගේ පොඩි යාලූ........ (ලකුණු 10)